සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

අවසාන වාර පරීක්ෂණය - 2024
மூன்றாம் பருவ சோதனை -2024
Third Term Test - 2024

13 ශ්‍රේණිය
தரம் 13
Grade 13

බෞද්ධ ශිෂ්ටාචාරය I
பௌத்த நாகரீகம் I
Buddhist Civilization I

45 | S | I

කාලය - පැය දෙකයි
2 மணி நேரம்
Time – 2 hours

**උපදෙස් :**

* සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය යොදන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන හෝ උත්තරය තෝරාගෙන එය ලකුණු කරන්න.

---

1. බ්‍රාහ්මණ ඉගැන්වීම්වලට අනුව තවුස් දම් රැකීම සඳහා වනගත වීම, එහිදී සිය අභිමතය පරිදි බිරිය ද කැටිව යා හැකි බවත් පෙන්වා දී ඇත්තේ,
   (1) ගෘහස්ථ ආශ්‍රමය තුල දීය.
   (2) වෛශ්‍ය වර්ණය සතු කාර්යකි.
   (3) බ්‍රාහ්මණ ආශ්‍රමය තුල දීය.
   (4) වානප්‍රස්ථ ආශ්‍රමය තුල දීය.
   (5) සන්‍යාසී ආශ්‍රමය තුල දීය.

2. බ්‍රාහ්මණ සමයාගත සමාජය තුල ප්‍රමුඛතම ආගමික සංස්කාර විධියකි යාගය එහි දී යාගයේ අධ්‍යක්ෂකවරයා ලෙස අත්‍යාවශ්‍ය කාර්යක නිරත වූයේ,
   (1) යාග කාරක.
   (2) උද්ගාතෘ.
   (3) හෝතෘ.
   (4) යාඥා ග්‍රාහක.
   (5) අධිවර්සු.

3. අමරාවික්ඛේප වාදය හෙවත් සංසයවාදය ඉදිරිපත් කරන ලද්දේ,
   (1) සංජය බෙල්ලට්ඨිපුත්ත ය.
   (2) අජිත් කේසකම්බල ය.
   (3) පකුධ කච්චායන ය.
   (4) පූර්ණ කස්සප ය.
   (5) මක්ඛලිගෝසාල ය.

4. කුල භේදය පදනම් විරහිත එකක් බවත්, උපතින් නොව ක්‍රියාවෙන් පුද්ගලයෙකු උසස් පහත් වන බවත්, වසල සූත්‍රයේදී බුදු රදුන් පෙන්වා දී ඇත්තේ,
   (1) ඓතිහාසික සාධකය ඔස්සේ ය.
   (2) සමාජ විද්‍යාත්මක සාධකය ඔස්සේ ය.
   (3) ආචාර විද්‍යාත්මක සාධකය ඔස්සේ ය.
   (4) ජීව විද්‍යාත්මක සාධක ඔස්සේ ය.
   (5) මනෝවිද්‍යාත්මක සාධක ඔස්සේ ය.

5. ක්‍රි.පූ. 6 වන සියවසේ සමාජගතව පැවති ආගමික හා දාර්ශනික මතවාද අතරින් කිහිපයක් පහත දැක්වේ.

A. දානයෙන් ඉන්ද්‍රිය දමනයෙන්, සත්‍යවචනයෙන් කිසිදු පිනක් නැත.
B. මරණින් පසු සත්වයාගේ සතර මහා භූත විශ්වයේ සතර මහා භූත හා එක්වන බව .
C. සමස්ථ පෘතුවියේ සියලු ප්‍රාණීන් මරා, එකම මස් ගොඩක් කළද එයින් කිසිදු පවක් අත් නොවේ.
D. සත්වයාගේ සසර ගමන හා විමුක්තිය ස්වභාව නියතියකට අනුව සිදු වේ.
E. පෙර කල කර්ම ගෙවා දැමීමෙන් සහ නව කර්ම නොකිරීමෙන් දුකින් නිදහස් වේ.

ඉහත ප්‍රකාශ අතුරින් පූර්ණකස්සපගේ ඉගැන්වීම් ඇතුලත් වන්නේ,

(1) A සහ B. (2) A සහ C.
(3) B සහ D . (4) B සහ C.
(5) C සහ E.

6. පරන්තප රජුගේ පුත් උදේන රජු, බුද්ධ කාලීන පාලකයා සේ කටයුතු කල මහා රජුගේ අග නගරය වූයේ,

(1) සාවත්ථිය යි. (2) කෝසම්බිය යි.
(3) රජගහ නුවර යි. (4) විශාලාව යි.
(5) උදේනී නුවරට යි.

7. තමන් බුදු රදුන් හා කරුණු කිහිපයකින් සමාන යැයි පැවසූ කොසොල් රජුගේ රජ්‍යයේ බුදු රදුන් ගත කල වස් කාල ගණනින්,

(1) 25 කි. (2) 27 කි.
(3) 28 කි. (4) 24 කි.
(5) 26 කි.

8. වෙළදාම සුලු හා මධ්‍යම පරිමාණ, මහා පරිමාණ වශයෙන් ද සංචාරක, පදික, ස්ථාවර වෙළදාම, දේශීය, විදේශීය වශයෙන්ද ක්‍රි.පූ. 6 දී දක්නට ලැබුණු අතර ඒ සඳහා භාවිතා කල වෙළඳ මාවත්,

(1) දෙකක් තිබුණි. (2) පහක් තිබුණි.
(3) තුනක් තිබුණි. (4) හතරක් තිබුණි.
(5) හයක් තිබුණි.

9. “සිව් සස් සිය නැනින්..............................”
යනාදී පද්‍යයෙන් විස්තර වන බුදු ගුණය කුමක් ද?

(1) සුගත. (2) භගවා.
(3) සත්ථා. (4) අනුත්තර පුරිසධම්මසාරතී.
(5) බුද්ධ.

10. බුදු රජාණන් වහන්සේ ප්‍රශ්න විසඳු විවිධ ක්‍රම පිළිබඳව පෙළ දහමේ බොහෝ තැන්වල සඳහන් වේ. එහි දී ප්‍රශ්නය පසෙකින් තැබීම යනු,

(1) විභජ්ජව්‍යාකරණ ය. (2) පුටිපුච්චා ව්‍යාකරණ ය.
(3) ඒකාංස ව්‍යාකරණ ය. (4) ඨපනී ය.
(5) අට්ඨුප්පත්තික ය.

11. “තමන් වහන්සේ ධර්මය දේශනා කරන්නේ වෙනත් ආගමිකයින් ශ්‍රාවකත්වයට හරවා ගැනීමේ අරමුණින් නොවන බව වදාළේ”,

(1) අරියපරියේසන හා සිගාලෝවාද සූත්‍රවල ය. (2) උපාලි සූත්‍රයේ හා අරියපරියේසන සූත්‍රවල ය.
(3) උපාලි සූත්‍රය හා මහා පරිනිබ්බාන සූත්‍රවල ය. (4) උපාලි සූත්‍රය හා උදුම්බරික සිහනාද සූත්‍රවල ය.
(5) අරියපරියේසන හා උදුම්බරික සිහනාද සූත්‍රවල ය.

12. "මිනිස් වර්ගයාගෙන් වැඩිම සංඛ්‍යාවකින් පූජා ලද තැනැත්තා ලෙස ඉතා පහසුවෙන් වෙන් කොට දැක්විය හැක්කේ බුදු රජාණන් වහන්සේ ය" ඉහත ප්‍රකාශය සිදු කරන ලද්දේ,
(1) එඩ්වින් ආනෝල්ඩ් ය.
(2) බර්ට්‍රන්ඩ් රසල් ය.
(3) මහාචාර්ය සෝණ්ඩර්ස් ය.
(4) මහචාර්ය මැක්ස් මුලර් ය.
(5) මහාචාර්ය ලක්ෂ්මී නරසු ය.

13. පහත සඳහන් ප්‍රකාශ අතුරින් නොගැලපෙන ප්‍රකාශය වන්නේ,

A. සම්පසාදිනීය සූත්‍රය දේශනා කිරීමෙන් බුදු රදුන්ගේ පැසසුමට ලක්වීම.
B. බෙල්ලට්ඨිසීය තෙරුන් වහන්සේ උපාධ්‍යායන් වහන්සේ වීම
C. ගැඹුරු දහම්කරුණු සරල ලෙස විස්තර කිරීමේ හැකියාව
D. "වේදනා පරිග්ගහ" සූත්‍රය අසා අරහත් ඵලයට පත් වීම

(1) A ය.
(2) A හා B ය.
(3) C හා D ය.
(4) C ය.
(5) B ය.

14. "අත්තකාර, පරකාර, ආරම්භ ධාතු, නික්කම ධාතු, ඨිති ධාතු, උපක්කමධාතු යන ඉගැන්වීම් තුළින්",
(1) පුද්ගල ශක්තිය අර්ථවත්කෙරේ.
(2) පුද්ගල පෞරුෂ ලක්ෂණ අර්ථවත් කෙරේ.
(3) පුද්ගල ස්වාමීත්වය අර්ථවත් කෙරේ.
(4) පුද්ගල වගකීම අර්ථවත් කෙරේ.
(5) පුද්ගල ස්වච්ඡන්දතාවය අර්ථවත් කෙරේ.

15. පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) සමාජ ප්‍රභවය හා විකාශය ඊශ්වර නිර්මාණවාදය මත පමණක් පදනම් ව පතින බව.
(2) සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳව බෞද්ධ ඉගැන්වීම් මගින් නිර්මාණවාදී සංකල්ප බැහැර වේ.
(3) පාරසරික, ආර්ථික, දේශපාලන සාධක පමණක් සමාජ ප්‍රභවයට හේතු වූ බව.
(4) ආචාර විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක සාධක පමණක් බලපා ඇති බව.
(5) සමාජ ප්‍රභවය හා විකාශය සංකල්පමය වශයෙන් පමණක් පෙන්වා දී තිබේ.

16. ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ දක්ෂතා පදනම් කර ගනිමින් තනතුරු ප්‍රධානය කළ බව අංගුත්තර නිකායේ ඒතදග්ග පාලියේ සඳහන් වේ. ඒ අනුව "විරරාත්‍රඥ" භික්ෂුණීන් අතර අග්‍රස්ථානය හිමි වූයේ,
(1) මහා ප්‍රජාපතී ගෝතමී රහත් තෙරණින්ට ය.
(2) ධම්ම දින්නා රහත් තෙරණින් වහන්සේට ය.
(3) උත්පලවන්ණා රහත් තෙරණින් වහන්සේට ය.
(4) පටාචාරා රහත් තෙරණින් වහන්සේට ය.
(5) ඛේමා රහත් තෙරණින් වහන්සේට ය.

17. පහත දැක්වෙන්නේ රාජ්‍ය පාලනයට අයත් බෞද්ධ ඉගැන්වීම් වේ. එහි දී කූටදන්ත සූත්‍රාගත දේශපාලන මූලධර්ම අනුව සාර්ථක රජා පාලකයෙකු වීමට අවශ්‍ය සුදුසුකම් ඇතුලත් වරණය වන්නේ,
A. බ්‍රාහ්මණ ගෘහපතියන්ට දැහැමි රැකවරණය සැලසීම
B. මනා දැන උගත්කමකින් යුක්ත වීම
C. බලවත් වූ අණ පිළිපදින සිවුරඟ සෙනඟක් ඇත්තකු වීම.
D. අපරාධ මර්ධනය කරමින් අපරාධ වැලැක්වීම
E. ප්‍රසාදය පළවන සුළු තැනැත්තෙකු වීම

(1) A, B, සහ C යි.
(2) B, C සහ E යි.
(3) B, C සහ E යි.
(4) C, D සහ E යි.
(5) B, A සහ D යි

18. බෞද්ධ රාජ්‍ය පාලකයෙකු තම පාලන තන්ත්‍රය තුල සිව් වැදෑරුම් ජාතික ප්‍රතිපදා වට අනුගත වෙමින් තම රාජ්‍ය සෞභාග්‍යමත් හා සුරක්ෂිත භාවයෙන් ගොඩනැගීමට නම්,
(1) දස රාජ ධර්මවලට අනුව පාලනය මෙහෙය විය යුතුය.
(2) සතර අගතිවලින් මිදී පාලනය මෙහෙය විය යුතුය.
(3) සප්ත අපරිහානීය ධර්මවලට අනුව පාලනය මෙහෙය විය යුතුය.
(4) පංචශීල ප්‍රතිපදාවට අනුව පාලනය මෙහෙය විය යුතුය.
(5) දස සක්විතිවත්වලට අනුව පාලනය මෙහෙය විය යුතුය.

19. මිනිසාගේ හොඳ නරක තීරණය කිරීම සඳහා අවශ්‍ය මිනුම් දඬු කිහිපයක් බුදු දහමේ පෙන්වා දී තිබේ. ඒ අතර අත්තූපනායික ධර්ම පරියාය පිළිබඳව කරුණු දැක ගත හැක්කේ,
(1) මහා සුදස්සන සූත්‍රයේය
(2) කූට දන්ත සූත්‍රයේය
(3) සිගාලෝවාද සූත්‍රයේය
(4) වේළුද්වාර සූත්‍රයේය
(5) කාලාම සූත්‍රයේය

20. බුදු දහමේ දස කුසල් මෙන්ම දස අකුසල් ද උගන්වයි. ඊට අදාලව කයින්, වචනයෙන්, සිතින් යන ත්‍රිවිධ ද්වාරයෙන් කුසලාකුසල කර්ම සිදු වේ. ඊට එල විපාකද වෙන වෙනම දැක්වෙන අතර අභිද්‍යාවෙන් බැහැරවීම,
(1) කායික මෙන්ම මානසික කුසලයකි
(2) මානසික කුසලයකි
(3) කායික කුසලාකුසලයකි
(4) වාචසික කුසලයකි
(5) මානසික හා වාචික කුසලාකුසලයකි

21. වසරක් පාසා යෞවන සමිතිය මගින් සංවිධානය කරන ධර්ම දේශනාමය පිංකඅම මෙවර ද පැවැත් වූ අතර මියගිය ගම්වාසීන්ට පිං පැමිණ වීම ප්‍රධාන අරමුණු අතර විය. හේවිසි නාද පවත්වමින් දේශකයන් වහන්සේ වඩමවා ගත් තරුණ පිරිස මහත් ගෞරවයෙන් උන්වහන්සේගේ පා දෝවනය කොට, උන් වහන්සේට ගරු බුහුමන් දක්වා වන්දනා මාන කොට දැහැත් ගිලන්පස පිළිගනවන ලදී. පිරිස පංචශීලයේ පිහිටුවා දස පුන්‍ය ක්‍රියා පිළිබඳව පවත්වන ලද උන්වහන්සේගේ සාරවත් දේශනාව සියලු දෙනා කර්මඵල විශ්වාස කරමින් සම්‍යක් දෘෂ්ටියෙන් ශ්‍රවණය කළේය.අවසානයේ දහම් පඬුරු පුදා, පැන් වඩා, මියගිය සාමාජිකයින්ට පිං පැමිණ වූ සැදැහැතියෝ සාදු කියා පිං අනුමෝදන් කොට පිංකම හමාර කලහ.
මෙම ඡේදයට අනුව ධර්ම දේශනා පිං කමට සහභාගී වූවෝ දස පුන්‍ය ක්‍රියාවලින්
(1) නවයක් සිදු කළහ
(2) හයක් සිදු කළහ
(3) අටක් සිදු කළහ
(4) හතක් සිදු කළහ
(5) හයක් සිදු කළහ

22. අමූලිකා ශ්‍රද්ධාවේ විශේෂ ලක්ෂණය ලෙස,
(1) තෙරුවන් කෙරෙහි අසීමිත භක්තියක් පැවතීම පෙන්වා දිය හැකිය
(2) තෙරුවන් කෙරෙහි අසීමිත ශ්‍රද්ධාවක් පැවතීම පෙන්වා දිය හැකිය
(3) පිනට කැප වූ සිතක් පහලව තිබීම ලෙස පෙන්වා දිය හැකිය.
(4) ශ්‍රද්ධාව හා ප්‍රඥාව සමානව පැවතීම පෙන්වා දිය හැකිය.
(5) තෙරුවන් පිළිබඳව අචල ශ්‍රද්ධාවක් පැවතීම පෙන්වා දිය හැකිය.

23. දිළිඳුකම හෙවත් දුප්පත්කම පුද්ගලයාට දුකකි.ගෘහස්ථ ජීවිතය සාර්ථක කර ගැනීමට අවැසි සැප හතරක් අංගුත්තර නිකායේ අණන සූත්‍රය මගින් පෙන්වා දී ආර්ථික සමෘද්ධිය ඇති කර ගැනීමට උපදෙස් ලබා දී ඇත.එම සැප අතර "භෝග සුඛ" යනුවෙන් පෙන්වා දී ඇත්තේ,
(1) ධනය ඇතැයි සිතීමෙන් ලබන සතුටයි.
(2) නිවැරදිව ජීවත්වීමෙන් ලබන සතුටයි.
(3) ධනය තැන්පත් කිරීමෙන් ලබන සතුටයි.
(4) ධනය පරිභෝජනය කිරීමෙන් ලබන ස්තුටයි.
(5) ණය නොවීමෙන් ලබන සතුටයි.

24. පරිසර සංරක්ෂණය පිළිබඳව අගනා ඉගැන්වීම් රැසක් බෞද්ධ සූත්‍ර දේශනා තුල අන්තර්ගතය මෙයින් වෘක්ෂලතා හා පරිසර සංරක්ෂණයට අදාල ඉගැන්වීම් ඇතුලත් සූත්‍රයක් වන්නේ,

(1) මහා පරිනිබ්බාන සූත්‍රයයි.
(2) මෙත්ත සූතරයයි.
(3) වනරෝප සූතරයයි.
(4) චක්කවත්ති සිහනාද සූත්‍රයයි.
(5) වණිජ්ජා සූත්‍රයයි.

25. සිගාලෝවාද සූත්‍රයට අනුව නැගෙනහිර හා දකුණු දිශාවන්ගෙන් නියෝජනය වන්නේ,

(1) පැවිදි උතුමන් සහ ගුරුවරුන් ය.
(2) දෙමාපිය සහ ගුරුවරුන් ය.
(3) දෙමාපියන් සහ මිතුරන් ය.
(4) දෙමාපියන් සහ අඹුදරුවන් ය.
(5) මිතුරන් සහ අඹුදරුවන් ය.

26. දීඝ නිකායේ සිගාලෝවාද සූත්‍රයේ බෝග විනාශ මුඛයකින් සිදුවාන හානි හය බැගින් කරුණු තිස් හයක් දේශනා කොට ඇත. ඒ අතරින් "මත් ද්‍රව්‍ය භාවිතයෙහි" ආදීනවයක් ලෙස සැලකෙන්නේ,

(1) බොහෝ දුක් කරදරවලට භාජනය වීම.
(2) මිතුරන්ගේ අප්‍රසාදයට භාජනය වීම.
(3) ප්‍රඥාව දුර්වල වීම.
(4) බොහෝ දෙනාගේ සැකයට භාජනය වීම.
(5) අවාහ විවාහ සඳහා නොපතන පුද්ගලයෙක්වීම.

27. "අත්තසම්මා පණිධීච" යන මංගල සූත්‍රාගත පාඨයෙන් අර්ථවත් වනුයේ,

(1) තිදොර මනාව හික්මවා ගැනීමයි.
(2) පෙර කළ පින් ඇත්හි බවයි.
(3) සිත මනාසේ පිහිටුවා ගැනීමය.
(4) නිවැරදි කර්මාන්ත ඇති බවයි.
(5) අඹුදරුවන්ට සංග්‍රහ කිරීමයි.

28. "කම්මැලි වූ කායික චෛතසික වීර්ය නැති කෙනෙකුගේ සියක් අවුරුදු ජීවිතයට වඩා දැඩි වීරයයෙන් යුක්තයාගේ එක දවසක ජීවත් වීම ඉතා උතුම් ය."යන අර්ථය ප්‍රකාශ වන ධම්මපද ගාථාව කුමක් ද?

(1) ජයං වේරං පසවති .........................
(2) අත්තනාව කතං පාපං ..............................
(3) කායේන සංවරෝ සාධු .............................
(4) යෝ වේ වස්සතං ජීවේ ...............................
(5) නිධීනංව පවත්තාරං .................................

29. සුදුසු ප්‍රදේශයක වාසය කිරීමෙන් යහපතක් ම සිදු වන බව හොඳින් ම දැන සිටි ගුණදාස උපාසකතුමා ගමේ වෙසෙන පණ්ඩිත ජනයාගේ ඇසුර ට ප්‍රිය කළේය. සමාජයේ වෙසෙන පිදිය යුත්තන්ට ඉහළින් ම පුද සත්කාර කළ හෙතෙම දෝෂාරෝපණවලදී තිදොර මනා සේ හික්මවාගෙන ඉවසීමෙන් යුක්තව, යහපත් වචන කතා කරන ප්‍රදේසයක වාසය කිරීමට වාසනාවන්ත වූයේ ය. මංගල සූත්‍රයට අනුව මෙහි අතුළත් මංගල කරුණු ගණන,

(1) පහකි. (2) හයකි. (3) හතකි.
(4) අටකි . (5) නවයකි.

30. බුද්ධ කාලීන ධර්මදූත සේවාවේ ප්‍රශස්ත කාර්යභාරයක් ඉටු කළ ධර්මධර හා විනයධර ජ්‍යෙෂ්ඨ ශ්‍රාවකයන් අතර ද්‍රෝණවත්ථු ප්‍රදේශයට වැඩම කොට තම ඥාති වර්ගයා ඇතුළු ප්‍රදේශවාසීන් සසුන්ගත කිරීමට කටයුතු කළ භික්ෂූන් වහන්සේ වන්නේ,

(1) මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ය.
(2) කොණ්ඩඤ්ඤ මහරහතන් වහන්සේ ය.
(3) සැරියුත් මහරහතන් වහන්සේ ය.
(4) මුගලන් මහරහතන් වහන්සේ ය.
(5) මහාකච්චායන මහරහතන් වහන්සේ

31. මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ........................ භික්ෂූන් අතර අග තනතුර හොබවමින් ගමින් ගමට ගොස් ධර්ම ප්‍රචාරය කිරීම ධර්මදූත මෙහෙවර ඵලදායි වීමට හේතු විය.

(1) නුවණැති. (2) ධූතංගධාරී.
(3) චිරරාත්‍රඥ. (4) ධර්ම කථික.
(5) ඍද්ධිමත්.

32. "බුදුරජාණන් වහන්සේ විසින් ගැයුවා වූ ධර්මය නොයෙක් ජාතියෙහි මල් එක මලස්නෙක සැලුවා සේ ඒ ඒ සත්තවයන් උදෙසා දෙසූ හෙයින් පිළිවෙලක් නැතිව අනාගතයෙහි නොපවත්නා ලෙස තැබුයේ ය. එසේ හෙයින් දැන් ම ධර්ම සංගායනාව කරනු කැමතියේ .................."යන ප්‍රකාශය ඇතුළත් ග්‍රන්ථය ලෙස සැලකෙන්නේ

(1) මහාවංශය. (2) ථූපවංශය.
(3) සමන්තපාසාදිකාව. (4) පූජාවලිය.
(5) සද්ධර්මාලංකාරය.

33. තමන් වහන්සේගේ ඇවෑමෙන් ධර්ම විනය ශාස්තෘත්වයෙහිලා සැලකිය යුතු යැයි පිරිනිවීමට ආසන්න සමයෙහි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කොට ඇතැයි සඳහන් සූත්‍රය කුමක් ද?

(1) දී.නි.සංගීති සූත්‍රය.
(2) දී.නි.දසුත්තර සූත්‍රය.
(3) ම.නි. ගුලිස්සානි සූත්‍රය.
(4) දී.නි. මහාපරිනිබ්බන සූත්‍රය.
(5) ම.නි. සම්මාදිට්ඨි සූත්‍රය.

34. ක්‍රි.ව. 983 – 995 අතර කාලය තුළ වික්‍රමශිලා විශ්වවිද්‍යාලයේ ද්වාරපණ්ඩිතවරුන් විද්‍යා මණ්ඩප භාරව කටයුතු කර ඇති ආකාරය නිවැරදි ව ගලපා ඇති පිලිතුර තෝරන්න.

| | | | |
|---|---|---|---|
| • රත්නාකර ශාන්ති | A | - | පෙරදිග දොරටුව |
| • වාගීෂ්වර කීර්ති | B | - | බටහිර දොරටුව |
| • නරෝපා | C | - | පළමුවැනි දොරටුව |
| • ප්‍රඥා කරමති | D | - | දකුණු දොරටුව |
| • රත්න වජ්‍ර | E | - | උතුරු දොරටුව |

(1) ABDEC. (2) ABEDC.
(3) ADECD. (4) ABCED.
(5) ABCDE.

35. බුදු දහම දේශාන්තර ව්‍යාප්තියට පත්කරලීම සඳහා තෙවන ධර්ම සංගායනාව ඉවහල් විය. මොග්ගලී පුත්තතිස්ස තෙරුන්ගේ අනුශාසනා පරිදි රටවල් නවයකට ධර්ම දූත කණ්ඩායම් යවනු ලැබූහ. ඒ අතරින් මහීසමණ්ඩලය, වනවාස දේශය, අපරන්ත දේශය යන ප්‍රදේශවලට පිටත් කර යවනු ලැබූ ධර්ම දූත කණ්ඩායම්වල නායකත්වය දරණ ලද්දේ,

(1) මජ්ඣන්තික, මහාදේව, රක්ඛිත යන හිමිවරුන් ය.
(2) මහාදේව, රක්ඛිත, මහා ධම්මරක්ඛිත යන හිමිවරුන් ය.
(3) මහාරක්ඛිත, මජ්ඣිම, රක්ඛිත යන හිමිවරුන් ය.
(4) මහාරක්ඛිත, මජ්ඣිම, සෝණ හා උත්තර යන හිමිවරුන් ය.
(5) මහාදේව, රක්ඛිත, යෝනක ධම්මරක්ඛිත යන හිමිවරුන් ය.

36. කණිෂ්ක අධිරාජයාගේ රාජ සභාවේ සිටි බෞද්ධ මහා පඬිවරයෙක් වන්නේ,

(1) ශාන්ත රක්ෂිත හිමිය.
(2) බුද්ධඝෝෂ හිමිය.
(3) නාගර්ජුන හිමිය.
(4) ධර්මාකර හිමිය.
(5) ධර්මපාල හිමිය.

37. මෞර්ය වංශයේ තුන්වන පාලකයා වූ අශෝක රජතුමා බෞද්ධ සාහිත්‍යයේ ධර්මාශෝක නමින් ද හින්දු සාමයික ග්‍රන්ථවල ............................ නමින්ද හැඳින්වේ.
(1) අශෝකවර්ධන.
(2) ද්විතීක අශෝක.
(3) චණ්ඩාශෝක.
(4) පියදස්සීලාජා.
(5) දේවානම්පිය දසි.

38. පහත සඳහන් වන්නේ භාරතයේ පැවති බෞද්ධ විශ්වවිද්‍යාල සම්බන්ධ ප්‍රකාශ කිහිපයකි.

A. ගොඩනැගිල්ලක රසායනාගාරයක්, වෛද්‍ය විද්‍යාලයක් හා නේවාසිකාගාරයක් තිබිණි.
B. විශ්වවිද්‍යාල භූමියෙන් බුද්ධ ප්‍රතිමා, බෝසත් ප්‍රතිමා, දේව ප්‍රතිමා, ශිලාලේඛන සොයා ගෙන ඇත
C. කුලපති යටතේ ප්‍රධාන කෘත්‍යාධිකාරී මණ්ඩල දෙකක් තිබිණි
D. පුස්තකාලයයිය අරමුදලක් තිබූ බව ගුහසේන රජතුමා විසින් පිහිටුවන ලද සෙල්ලිපියක දැක්වේ
E. හියුංසියැං තෙරුන්ගේ වාර්තාව අනුව මෙම විශ්වවිද්‍යාලයේ සංඝාරාම 100 කි.

මෙයින් වලභි විශ්වවිද්‍යාලය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ වන්නේ

(1) AB පමණි.
(2) ABC පමණි.
(3) ABCD පමණි.
(4) CDE පමණි.
(5) DE පමණි.

39. විවිධ ඇදහිලි හා විශ්වාසයන්ට අනුග්‍රහය දැක් වූ පණ්ඩුකාභය රජු යක්ෂ වන්දනාව පිළිබඳව විශේෂ සැලකිල්ලක් දැක් වූ බව මහාවංශ වාර්තාවෙන් පැහැදිලි වේ. ඒ අනුව රජු විසින් අනුරාධපුර නගරයට නැගෙනහිර දෙසින් දෙවොලක් ඉදිකර දෙන ලද්දේ,
(1) කාලවේල යක්ෂයා උදෙසාය.
(2) චිත්තරාජ යක්ෂයා උදෙසාය.
(3) වළවාමුඛී යක්ෂණිය උදෙසාය.
(4) ජුතින්ධර යක්ෂයා උදෙසාය.
(5) මහේජ යක්ෂයා උදෙසාය.

40. පහත සඳහන් වන්නේ ශ්‍රී ලංකාවේ ගෞරවාදරයට ලක් වූ දෙවිවරු ගැනය.

| | |
|---|---|
| (1) බුදුරජාණන් වහන්සේගෙන් කේශ ධාතු ලබා ගන්නේ | A කම්මාර දෙවියන් ය |
| (2) ලෝකුරුවන්ට අධිපති | B පූර දෙවියන් ය |
| (3) දඩයක්කරුවන්ට අධිපති | C ව්‍යාධ දෙවියන් ය |
| (4) අනුරාධපුරයට පමණක් අධිපති | D සුමන සමන් දෙවියන් ය |
| (5) සිරිලක් දිවයිනට ම අධිපති | E උපුල්වන් දෙවියන් ය |

ඉහත ප්‍රකාශ නිවැරදිව ගලපා පිළිතුර තෝරන්න

(1) DACBE.
(2) ACBED.
(3) DCABE.
(4) EDCBA.
(5) BCDEA.

41. පහත සඳහන් ප්‍රකාශ අතරින් සත්‍ය ප්‍රකාශය වන්නේ,

(1) අභයගිරි විහාරයේ ප්‍රයෝජනය පිණිස ගජබා රජතුමා විසින් ගාමිණී තිස්ස ජලාශය ඉදි කිරීම.
(2) කුපික්කල තිස්ස හිමි විසින් වලගම්බා රජුට නැවත රාජ්‍ය ලබා ගැනීම සඳහා උදව් ලබා දීම.
(3) දෙවනපෑතිස් රජතුමා හත්ථාල්හක මෙහෙණවර ඉදි කොට භික්ෂුණීන් වහන්සේලාට පූජා කිරීම.
(4) දෙවනපෑතිස් රජතුමා අනුරාධපුරයේ ජේතවනාරාමය ඉදි කොට භික්ෂූන් වහන්සේලාට පූජා කිරීම.
(5) මහසෙන් රජතුමා අනුරාධපුරයේ ජේතවනාරාම විහාරය ඉදි කොට භික්ෂූන් වහන්සේලාට පූජා කිරීම.

42. ලක්දිව බුදු සසුන පිහිටුවීමෙන් අනතුරුව ශාසනමාමක රජවරුන් විසින් බෞද්ධ ආරාම මෙන්ම පිරිවෙන් ද කරවා සසුනට පූජා කරන ලදී. එම පිරිවෙන් අතුරෙන් වියපත් අට ගණ යන නමින් සම්භාවනාවට පත් මූලායතන අටක් පැවතුනි. එම මූලායතන අට අයත් ඒවායෙන් කිහිපයක් පහත දැක්වේ.

A. - උත්තර මූල
B. - ගලතුරු මූල
C. - විල්ගම් මූල
D. - කප්පර මූල
E. - දක්ඛිණ මූල

ඉහත සඳහන් මූලායතන අතරින් මහාවිහාරයට අයත් මූලායතන තෝරන්න.

(1) A හා B.
(2) A හා C.
(3) B හා C.
(4) D හා E.
(5) A හා E.

43. පහත සඳහන් ශාසනික සේවාවන් ඉටු කරන ලද රජවරු කවුරුන් ද?

A. මහාවිහාරය සීමාව පිහිටුවා මහාවිහාරය ඉදි කර බුදු සසුනට පිළිගැන්වීම.
B. විනය සංගායනාවක් පවත්වා ශාසන චිරස්ථිතියට දායක වීම.
C. චේතියගිරියේ අටසැට ලෙන් ඉදිකර මිහිඳු හිමියන් ඇතුලු භික්ෂු පිරිසට පහසුකම් සැලසීම.
D. භික්ෂුණීන් සඳහා අශෝකාරාමය නම් ආරාමය ඉදි කිරීම.

(1) දුටුගැමුණු රජතුමා.
(2) වළගම්බා රජතුමා.
(3) දේවානම්පියතිස්ස රජතුමා.
(4) මහසෙන් රජතුමා.
(5) වසභ රජතුමා.

44. ප්‍රාග් බෞද්ධ ලංකාවේ පැවති දේශීය සම්භවයක් නොවන ආගම් ඇතුළත් වරණය තෝරන්න.

(1) බ්‍රාහ්මණාගම, යකුන් ඇදහීම.
(2) බ්‍රාහ්මණාගම, ජෛනාගම.
(3) වෘක්ෂ ඇදහීම, ජෛනාගම.
(4) මළවුන් ඇදහීම, නාගයන් ඇදහීම.
(5) ශිව ආගම, දේවතාවුන් ඇදහීම.

45. මියන්මාරයට බුදුදහම ලැබීමෙන් පසු මියන්මාර සංස්කෘතියේ ඇති වූ වෙනස්කම් කිහිපයක් පහත දැක්වේ.
A - කුලභේදය නොසලකා එකම ථෙරවාදී රාජ්‍ය බවට විරුදාවලිය ලැබීම.
B - ආසියාවේ වෙනත් කිසිදු කාන්තාවකට නොමැති නිදහසක් බුරුම කාන්තාවට හිමි වීම.
C - රාජ්‍ය ආගම බුද්ධාගම වූ අතර එය ආරක්ෂා කිරීමට රජය බැඳී සිටීම.
D - දෛනික ව ආගමික කටයුතුවල නිරත වීමට අවශ්‍ය පූජාසනයක් කාමරයක සකස් කර තිබීම.
E - ලොකු කුඩා සෑම අයෙකුගේ ම ගෙලෙහි බුද්ධ රූපයක් පැළඳගෙන සිටීම.
ඉහත ප්‍රකාශ අතුරින් මියන්මාරයට අදාළ තොරතුරු ඇතුළත් වරණය කුමක් ද?

(1) ABE.
(2) ABD.
(3) CDE.
(4) BCD.
(5) ABC.

46. තායිලන්තයේ වාර්ෂිකව පවත්වන උත්සව අතර ථායි රජතුමා අනිවාර්යයෙන් සහභාගීවන උත්සවය ලෙස සැලකෙන්නේ,

(1) පොසොන් උත්සවය. (2) හනමනිසූරි උත්සවය. (3) වෙසක් උත්සවය.
(4) කඨින පූජා උත්සවය. (5) තේ පානෝත්සවය.

47. ජපන් ජනයා විසින් බෞද්ධ චාරිත්‍රානුකූලව වාර්ෂිකව සමරනු ලබන "බුදුන් වහන්සේගේ පරිනිර්වාණය" සිහි ගන්වන උත්සවය හඳුන්වන්නේ,

(1) බොන් නමින් ය.
(2) නෙහන් නමින් ය.
(3) ජෝදෝ නමින් ය.
(4) හනමන්සූරි නමින් ය.
(5) තේ පානෝත්සවය නමින් ය.

48. ගැළපෙන ආකාරයට සසඳා පිළිතුර සොයන්න.

| | | | |
|---|---|---|---|
| 1. හොරයූජි විහාරය | - | A | - නරදයිබුත්සු ප්‍රතිමාව |
| 2. තෝදයිජි විහාරය | - | B | - හොරයූජි විහාරය |
| 3. ලෝකඩ බුදුපිළිමය | - | C | - භෛෂජ්‍ය ගුරු බුද්ධ ප්‍රතිමාව |
| 4. පැරණි දැවබුවා ගොඩනැගිල්ල | - | D | - වෛරෝචන බුදුරදුන්ගෙ පිළිමය |

ඉහත ප්‍රකාශවලට අනුව නිවැරදි වරණය තෝරන්න.

(1) ABCD. (2) CDAB. (3) CDAB.
(6) ADCB.

49. බුද්ධ ප්‍රතිමා පිළිබඳ කරුණු අධ්‍යනය කරන බොහෝ වියතුන්ගේ මතය වන්නේ භාරතීය බුද්ධ ප්‍රතිමා නිර්මාණයේ ආරම්භය ක්‍රි.ව. 1 වෙනි සියවසේ දී පමණ සිදුවුණු බවයි. මෙහිලා පුරෝගාමී වූයේ කනිෂ්ක රජුය. නමුත් මුලින් ම බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීමේ ගෞරවය ලාංකේය කලාකරුවන්ට හිමි වූයේ යැයි මත පළ කල විද්වතුන් අතර ප්‍රමුඛත්වය ගනු ලබන්නේ,

(1) ඩී.ටී. දේවේන්ද්‍ර, සිරිගුණසිංහ, නන්දදේව විජේසේකර
(2) ඩී.ටී. දේවේන්ද්‍ර, වින්සන්ට් ස්මිත්, පර්සි බ්‍රවුන්
(3) සිරිගුණසිංහ, වින්සන්ට් ස්මිත්, පර්සි බ්‍රවුන්
(4) නන්දදේව විජේසේකර, පර්සි බ්‍රවුන්, සිරිගුණසිංහ
(5) ඩී.ටී. දේවේන්ද්‍ර, හැවල්, සිරිගුණසිංහ

50. බුද්ධ ප්‍රතිමාව සම්බන්දයෙන් විවිධ විද්වතුන් විසින් මුද්‍රා රැසක් හඳුන්වා දී ඇත. ඒ අතරින් ධර්ම දේශනා විලාසයෙන්, ධර්මය පැහැදිලි කිරීම සාරානාත් බුද්ධ ප්‍රතිමාවෙන් පිළිඹිබු වන බව විද්වතුන්ගේ මතයයි.එම මුද්‍රාව හඳුන්වන්නේ,

(1) අභය මුද්‍රාව නමිනි. (2) ධ්‍යාන මුද්‍රාව නමිනි
(3) ධර්ම චක්‍ර මුද්‍රාව නමිනි. (4) වරද මුද්‍රාව නමිනි
(5) විතර්ක මුද්‍රාව නමිනි.

* *

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

අවසාන වාර පරීක්ෂණය - 2024
மூன்றாம் பருவ சோதனை -2024
Third Term Test - 2024

13 ශ්‍රේණිය
தரம் 13
Grade 13

බෞද්ධ ශිෂ්ටාචාරය II
பௌத்த நாகரீகம் II
Buddhist Civilization II

45 S II

කාලය - පැය තුනයි
3 மணி நேரம்
Time – 3 hours

උපදෙස් :
* I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න 3 ක් ද, තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න
* සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් හිමි වේ. (I කොටසේ එක් අනු ප්‍රශ්නයකට ලකුණු 2,3,4,5,6 බැගින් ද, II කොටසේ එස් අනු ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.)

## I කොටස

(1) i. වෛශ්‍ය වර්ණයට අයත් ස්වධර්ම හතරක් නම් කරන්න. (ල-02)

ii. "ආපද්" ධර්ම යන්න හඳුන්වන්න. (ල-03)

iii. බ්‍රාහ්මණ සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණ හතරක් ගෙනහැර දක්වන්න. (ල-04)

iv. අජිතකේශකම්බලගේ ඉගැන්වීම පෙන්වා දෙන්න. (ල-05)

v. සංජයබෙල්ලට්ඨිපුත්තගේ ඉගැන්වීම් බුදු දහමින් ප්‍රතික්ෂේප වන ආකාරය විමසීමට ලක් කරන්න. (ල-06)

(2) i. බුදු රජාණන් වහන්සේ "භගවා" නාමයෙන් හැඳින් වීමට හේතු වූ සාධක දෙකක් නම් කරන්න. (ල-02)

ii. නූතන විචාරකයින් විසින් බුදුරජාණන් වහන්සේ පිළිබඳව දක්වා ඇති නිර්වචනයක් ලියා දක්වන්න. (ල-03)

iii. බුදුරජාණන් වහන්සේ සතු වූ "තාදී ගුණය"ප්‍රකට වන අවස්ථා හතරක් කෙටියෙන් පහදන්න. (ල-04)

iv. බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය අවස්ථා පහක් ඇසුරින් ඇගැයීමට ලක් කරන්න. (ල-05)

v. පුද්ගල ජීවිතය සාර්ථක කර ගැනීමට ඛේමා රහත් මෙහෙණින් වහන්සේ හෝ අනේපිඬු සිටු තුමාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ ගෙනහැර දක්වන්න. (ල-06)

(3) i. "සුඛරාති අසාධුනී.............."යන ධම්ම පද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න. (ල-02)

ii. ඉහත 3 – I හි සඳහන් ගාථාවේ අර්ථය ලියා දකවන්න. (ල-03)

iii. මිත්‍ර - මිත්‍ර සම්බන්ධතාවය පිළිබඳව සිගාලෝවාද සූත්‍රයේ දක්වා ඇති යුතු කම් හා වගකීම් දහය නම් කරන්න. (ල-04)

iv. පුද්ගල හා සමාජ පරිහාණියට හේතු වන පරාභව සූත්‍රාගත කරුණු පහක් (05) කෙටියෙන් දක්වන්න. (ල-05)

v. මූලාශ්‍රගත සාධකවලට අනුව පවුල් සංස්ථාවේ ප්‍රභවය කෙසේ දැක්වෙන්නේ දැයි පෙන්වාදෙන්න. (ල-06)



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

## II කොටස

(4) i. නීතිගරුකවීම සාමූහික පැවැත්මට හා සන්තුෂ්ටිතාවයට මහ පාදන බව බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් පහදන්න. (ල-10)

ii. දන්දීම, ආගන්තුක සත්කාරය, වැඩිහිටියන්ට සැලකීම, පරෝපකාරය හා ගිලානෝපස්ථානය යන සාරධර්ම ලාංකේය සමාජයේ උන්නතියට හේතු වේ විමසන්න. (ල-10)

(5) i. මහරහතන් වහන්සේලා සෞන්දර්ය රසාස්වාදය කල ආකාරය නිදසුන් මඟින් පෙන්වා දෙන්න. (ල-10)

ii. විවේකය විනෝදයෙන් හා ධාර්මික ප්‍රීති සුඛයෙන් යුතුව ගත කරන ආකාරය බුදු සමයේ පෙන්වා දී ඇත්තේ කෙසේ දැයි ශනිදර්ශනාත්මකව දක්වන්න. (ල-10)

(6) i. සම්බුදු සසුනේ චිර පැවැත්ම උදෙසා ථේරවාදී ධර්ම සංගායනාවලින් සිදු වූ මෙහෙය ඇගයීමට ලක් කරන්න. (ල-10)

ii. අශෝක රජු බෞද්ධයෙකු බව සනාථ කරමින් ඔහුගෙන් සිදු වූ ශාසනික මෙහෙය මූලාශ්‍ර ගත සාධක ඇසුරින් පහදන්න. (ල-10)

(7) i. ජපන් සංස්කෘතිය බුදු දහමින් පෝෂණය වූ ආකාරය පැහැදිලි කරන්න. (ල-10)

ii. ශ්‍රී ලංකේය රාජ්‍ය පාලනය කෙරෙහි බෞද්ධ ආභාසය ලැබී ඇති ආකාරය ශනිදර්ශනාත්මකව විමසන්න. (ල-10)

(8) i. බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය මූලාශ්‍රගත සාධක මගින් පෙන්වා දෙමින්, මුද්‍රා පිළිබඳව හැඳින්වීමක් කරන්න. (ල-10)

ii. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකකට විස්තර සපයන්න.

1. වික්‍රමශිලා විශ්ව විද්‍යාලය
2. කෝට්ටේ යුගයේ සාහිත්‍යය.
3. මගධ රාජ්‍ය
4. දස කුසල් (ල-10)

* * *


(11) WWW.PastPapers.WiKi (11)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
අ.පො.ස. (උ.පෙළ) විභාගය / ஜி.இ.சி. (உயர் உரை) தேர்வு

විෂය අංකය / பொருள் எண் **45**

තෙවෙනි වාර පරීක්ෂණය
மூன்றாம் கால சோதனை

විෂයය / பொருள் **බෞද්ධ ශිෂ්ටාචාරය**

ලකුණු දීමේ පරිපාටිය / மதிப்பெண் நடைமுறை
I පත්‍රය / I காகிதம்

| ප්‍රශ්න අංකය கேள்வி எண் | පිළිතුරු අංකය பதில் இல்லை | ප්‍රශ්න අංකය கேள்வி எண் | පිළිතුරු අංකය பதில் இல்லை | ප්‍රශ්න අංකය கேள்வி எண் | පිළිතුරු අංකය பதில் இல்லை | ප්‍රශ්න අංකය கேள்வி எண் | පිළිතුරු අංකය பதில் இல்லை | ප්‍රශ්න අංකය கேள்வி எண் | පිළිතුරු අංකය பதில் இல்லை |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 4 | 21. | 5 | 31. | 2 | 41. | 4 |
| 02. | 5 | 12. | 3 | 22. | 1 | 32. | 4 | 42. | 3 |
| 03. | 1 | 13. | 5 | 23 | 4 | 33. | 4 | 43. | 3 |
| 04. | 3 | 14. | 1 | 24. | 3 | 34. | 2 | 44. | 2 |
| 05. | 2 | 15. | 2 | 25. | 2 | 35. | 5 | 45. | 5 |
| 06. | 2 | 16. | 1 | 26. | 3 | 36. | 3 | 46. | 4 |
| 07. | 1 | 17. | 3 | 27. | 3 | 37. | 1 | 47. | 2 |
| 08. | 3 | 18. | 5 | 28. | 4 | 38. | 5 | 48. | 2 |
| 09 | 5 | 19. | 4 | 29. | 2 | 39. | 1 | 49. | 1 |
| 10. | 4 | 20. | 2 | 30. | 2 | 40. | 1 | 50. | 3 |

* විශේෂ උපදෙස් / சிறப்பு வழிமுறைகள் :

එක් පිළිතුරකට / பதிலுக்கு ලකුණු 02 බැගින් / தலா 02 மதிப்பெண்கள்

මුළු ලකුණු / மொத்த மதிப்பெண் 1 x 50 = 50